## 71 වන ඉන්දීය නිදහස් දින සංවත්සරය

### ශ්‍රී ලංකාවේ ඉන්දීය මහ කොමසාරිස් තරංජිත් සිං සන්ධු මැතිතුමා සමඟ කළ සාකච්ඡාව

### *"ශ්‍රී ලංකාව අපට සුවිශේෂියි..."*

**ප්‍රශ්නය - ඉන්දීය නිදහස් දිනයේ 71 වන සංවත්සරය අදට යෙදී තිබෙනවා. මෙම විශේෂ දිනය සම්බන්ධයෙන් ඔබගේ අදහස කුමක්ද?**

පළමුවෙන්ම ඉන්දීය නිදහස් දිනයේ 71 වන සංවත්සරය නිමිත්තෙන් ඉන්දියානු පුරවැසියන්ටත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික, සමාජවාදී ජනරජයටත් එහි මිත්‍රශීලී ජනතාවටත් මාගේ සුභාශිංශන පිරිනැමීමට කැමතියි.

මෑතකදී නිදහස ලබාගත් සුළු ආර්ථික සම්පත් ප්‍රමාණයක් හිමි රාජ්‍යයක සිට ලෝකයේ ශීඝ්‍රයෙන්ම වර්ධනය වන ප්‍රධාන ආර්ථිකය දක්වා ඉන්දියාව බොහෝ සෙයින් වෙනස් වී තිබෙනවා. මා සිතන ආකාරයට ඉන්දියාව ලබා ගත් සුවිශේෂීම ජයග්‍රහණය වන්නේ ප්‍රජාතන්ත්‍රවාදයේ සහ බහුවිධභාවයේ සාර්ථකත්වයයි.

මෙය සැබවින්ම සුවිශාල ජයග්‍රහණයක්. ඔබ දන්නා පරිදි බිලියන 1.25ක ජනතාවක් ජීවත් වන ඉන්දියාව ඇතැම් විට ලෝකයේ වඩාත්ම සංකීර්ණ සහ බහුවිධ සමාජය විය යුතුයි. ලෝකයේ සියලු ප්‍රධාන ආගම් ඉන්දියාව තුළ පවතිනවා. එසේම ඉන්දියාව තුළ භාෂා සහ උප භාෂා 1,652 ක් භාවිතා වෙනවා. මෙම පොහොසත් සහ විචිත්‍ර බහුවිධභාවය ප්‍රජාතාන්ත්‍රික ව්‍යුහයන් යටතේ ආරක්ෂා කරගැනීමට ඉන්දියාව සමත්ව තිබෙනවා. සෑම දෙනාවම අප සංවර්ධනය කරා පියනගන මාවතේ රැගෙන යා යුතු බව අප දැඩිව විශ්වාස කරනවා.

ආර්ථික දියුණුව අපට ඉතා වැදගත් වන නමුත් අප හුදු ආත්මාර්ථය උදෙසා පමණක් කටයුතු නොකරන බව මා අවධාරණය කිරීමට කැමතියි. "වාසුදායිව කුටුම්බකම්" (මුළු ලොවම එක් පවුලකි) යන්න ඉන්දීය පාර්ලිමේන්තුවේ පිවිසුම අසලද දක්වා තිබෙනවා. අපට ඔබ සමඟ මෙන්ම සෑමදෙනා සමඟම ඉදිරියට යාමට අවශ්‍යයයි. "සබ්කා සාත් සබ්කා විකාස්"- එක්ව ප්‍රගතිය කරා... යන කියමන මෙම දැක්ම පිළිඹිබු කරනවා.

**ප්‍රශ්නය - මෑතකාලීන ඉන්දියා – ශ්‍රී ලංකා ද්විපාර්ශවීය සබඳතා ඔබ දකින්නේ කෙසේද?**

අපට ශ්‍රී ලංකාව සුවිශේෂියි. ශ්‍රී ලංකාවටත් එය එසේම බව අප දකින්නේ ඉතා නිහතමානීවයි. අප දෙරට අතර තිබෙන සම්බන්ධතාවයේ සුවිශේෂී ස්වභාවය පිළිඹිබු කරන උදාහරණ කිහිපයක් දැක්වීමට මා කැමතියි.

2015 මාර්තු මාසයේදී අග්‍රාමාත්‍ය මෝදි මැතිතුමාගේ ශ්‍රී ලංකා සංචාරය වසර 28කට පසුව ඉන්දීය අගමැතිවරයෙක් ශ්‍රී ලංකාවට පැමිණි පළමු අවස්ථාවයි. එතුමා නැවතත්, ශ්‍රී ලංකාව පළමු වරට සත්කාරකත්වය ලබාදුන් ජාත්‍යන්තර වෙසක් දින සැමරුමේ ප්‍රධාන ආරාධිත අමුත්තා වශයෙන් සහභාගී

වීම සඳහා 2017 මැයි මාසයේදී ශ්‍රී ලංකාවට පැමිණියා. මෙයට පෙර කිසිදු ඉන්දීය අග්‍රාමාත්‍යවරයෙක් වසර දෙකක් තුළ දෙවතාවක් ශ්‍රී ලංකාවට පැමිණ නැහැ.

එසේම, ශ්‍රී ලංකා ජනාධිපතිතුමා, අග්‍රාමාත්‍යතුමා සහ විදේශ අමාත්‍යතුමා තමන්ගේ පළමු නිල විදේශ සංචාරයන් සඳහා ඉන්දියාව තෝරාගත් බවත් බව සතුටින් සිහිපත් කිරීමට කැමතියි.

2018 මාර්තු මාසයේදී නව දිල්ලි නුවර පැවති ජාත්‍යන්තර සූර්යබල සන්ධානයේ සමාරම්භක සමුළුවට ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා සහභාගි වුණා. ඔබ දන්නා පරිදි මෙම සමුළුවේ සම සභාපතිත්වය දරන ලද්දේ ඉන්දීය අග්‍රාමාත්‍ය නරේන්ද්‍ර මෝදි මැතිතුමා සහ ප්‍රංශ ජනාධිපති එම්මානුවෙල් මැක්‍රොන් මැතිතුමා විසින්. ශ්‍රී ලංකාව තුළ සූර්යබල ව්‍යාපෘතීන් ක්‍රියාවට නැංවීම සඳහා ඇමරිකානු ඩොලර් මිලියන 100ක ණය මුදලක් ලබා දෙන බව මෙහිදී ප්‍රකාශ කෙරුණා.

එසේම 2017 නොවැම්බර් මාසයේදී නව දිල්ලි නුවර පැවති සයිබර් අවකාශය පිළිබඳ ගෝලීය සමුළුව සඳහා අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මැතිතුමා සහභාගී වීමද විශේෂ අවස්ථාවක්. මෙම සමුළුව, ආර්ථික සහයෝගීතාවය සහ සංවර්ධනය සඳහා වූ සංවිධානයට (OECD) අයත් නොවන රටකදී පැවැත්වූයේ ප්‍රථම වතාවටයි.

අපට ආඩම්බර විය හැකි තවත් "පළමු" අවස්ථා රසක් නුදුරු අතීතය තුළ පවතිනවා. දකුණු ආසියාතික චන්ද්‍රිකාවේ කොටස්කරුවෙකු වීමට එකඟත්වය පළකළ පළමු දකුණු ආසියානු රාජ්‍යය ශ්‍රී ලංකාවයි. ශ්‍රී ලංකාව මෑතකදී ජාතික දැනුම් ජාලය (National Knowledge Network - NKN) සමඟ එක්වූයේ එසේ එක්වූ පළමු සාක් රාජ්‍යය බවට පත්වෙමින්. මේ හරහා ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාලයන්ට ඉන්දියාවේ සහ ඉන් පිටත විශ්වවිද්‍යාල 1,600ක පමණ ප්‍රමාණයක් සමඟ ඩිජිටල් මාධ්‍ය ඔස්සේ සම්බන්ධ විය හැකියි.

මෙම වසරේ ජනවාරි මාසයේදී අපගේ තොරතුරු තාක්ෂණ අමාත්‍යතුමා ශ්‍රී ලංකාවට පැමිණි අවස්ථාවේදී අපගේ ජාතික තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය විසින් නිර්මාණය කරන ලද අන්තර්ජාල කාර්යාල (E-Office) පිළිබඳ නියමු ව්‍යාපෘතියක් දියත් කළා. මෙහිදී ශ්‍රී ලංකා රාජ්‍ය සේවයේ ප්‍රථම වතාවට රජයේ ලියැවිල්ලක් ඩිජිටල් ක්‍රමයට අත්සන් කිරීම සිදු වුණා.

මට මෙවැනි උදාහරණ රසක් දැක්විය හැකියි...

**ප්‍රශ්නය - බොහෝ ශ්‍රී ලාංකිකයන්ගේ අදහස වන්නේ ඉන්දියාවේ සංවර්ධන සහයෝගය ශ්‍රී ලංකාවේ ඇතැම් ප්‍රදේශවලට පමණක් සීමා වී ඇති බවයි. එය සත්‍යයක්ද?**

ශ්‍රී ලංකාව සමඟ ඇති අපගේ සංවර්ධන සහයෝගීතාවය පදනම් වන්නේ ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතා මතයි. ඉන්දියාව විසින් ශ්‍රී ලංකාවට ලබා දී ඇති සමස්ත සංවර්ධන ආධාර ප්‍රමාණය ආසන්න වශයෙන් ඇමරිකානු ඩොලර් බිලියන 3 ක් පමණ වන අතර ඉන් ඇමරිකානු ඩොලර් මිලියන 500 කට වඩා නැවත නොගෙවිය යුතු මූල්‍ය ප්‍රදානයන්. මෙහිදී වැදගත් වන්නේ සංඛ්‍යා දත්ත පමණක් නොවෙයි.

අපේ ව්‍යාපෘති සුවිශේෂියි. අප විශ්වාස කරන්නේ ශ්‍රී ලංකාව සමඟ ඒකාබද්ධව, ශ්‍රී ලංකාව හවුල්කරුවෙකු කරගනිමින් ව්‍යාපෘති සිදු කළ යුතු බවයි. අපගේ ව්‍යාපෘති ජනතා කේන්ද්‍රීයයි. එම ව්‍යාපෘති සාමාන්‍ය ජනතාවගේ ජීවිතවලට සෘජු බලපෑමක් ඇති කරනවා.

ඉන්දියාව ශ්‍රී ලංකාවේ සෑම පළාතකම ජනතා කේන්ද්‍රීය කුඩා ව්‍යාපෘති 70 කට ආසන්න ප්‍රමාණයක් සිදුකර තිබෙනවා. ව්‍යාපෘති 20 ක් පමණ දැනට ක්‍රියාත්මක වෙමින් පවතිනවා. මේවා එක් අංශයකට හෝ ප්‍රදේශයකට සීමා වී නැහැ. උතුර සිට දකුණ සහ බටහිර සිට නැගෙනහිර දක්වා දිවයිනේ සෑම

ප්‍රදේශයකම මෙම ව්‍යාපෘති ක්‍රියාවට නංවා තිබෙනවා. අනුරාධපුර ප්‍රදේශයේ නව ගමක් ඉදිකිරීම, පොළොන්නරුවේ ත්‍රෛභාෂා පාසල වැනි පාසල් ඉදිකිරීම, මහනුවර ශ්‍රී දළදා මාළිගාව යටතේ උඩරට නර්තන පුහුණු පාසලක් පිහිටුවීම, හම්බන්තොට ප්‍රදේශයේ ගොවි සහ ධීවර ප්‍රජාවට ජීවනෝපාය මාර්ග සඳහා සහාය ලබා දීම, මාතර රුහුණු සරසවියේ ආසන 1500 ක ශ්‍රවණාගාරයක් ඉදිකිරීම, යාපනයේ වැසි ජලය රැස් කිරීමේ ඒකක ඉදිකිරීම, මඩකලපුවේ සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීම යනාදිය අපේ ව්‍යාපෘති සඳහා උදාහරණයි. එසේම අප ශ්‍රී ලංකාවේ සෑම දිස්ත්‍රික්කයකම ආදර්ශ ගම්මානයක් බැගින් ඉදි කරනවා.

ශ්‍රී ලංකාවේ ඉන්දියානු නිවාස ව්‍යාපෘතිය ඉන්දීය ආධාර යටතේ විදේශ රටක ක්‍රියාත්මක විශාලතම ව්‍යාපෘතියයි. උතුරේ හා දකුණේ නිවාස 46,000 ක් ඉදිකර අවසන්. වතුකර ප්‍රදේශ වල නිවාස 14,000 ක් පමණ ඉදි වෙමින් පවතිනවා. ඉන්දියා - ශ්‍රී ලංකා මිත්‍රත්වය සලකුණු කරන තවත් එක් ව්‍යාපෘතියක් වන්නේ රටේ දහස් සංඛ්‍යාත ජනතාවගේ ජීවිත බේරා ගැනීම සඳහා උර දුන් හදිසි ගිලන් රථ සේවාවයි. මෑතකදී එම සේවාව දිවයින පුරා ව්‍යාප්ත කෙරුණා. අපගේ පොරොන්දු නිසි කලට ඉටු කිරීමට අප සමත්ව තිබෙනවා.

ඉන්දියාව විසින් ඇමරිකානු ඩොලර් බිලියන 1.3 ක පමණ ණය ආධාරයක් ශ්‍රී ලංකාවේ දුම්රිය ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම සඳහා ලබා දී තිබෙනවා. දශක ගණනාවක් තිස්සේ පැවති ගැටුම් වලින් පසුව උතුර හා දකුණ යා කරන ප්‍රධාන දුම්රිය මාර්ග සංවර්ධනය කෙරුණේ ඉන්දීය මූල්‍යාධාර යටතේයි. මෙම ණය ආධාරය යටතේ සුනාමියෙන් විනාශයට වූ පත් වූ මුහුදුබඩ දුම්රිය මාර්ගයද වැඩි දියුණු කරනු ලැබුවා. එසේම ඉන්දියාව ශ්‍රී ලංකාවට දුම්රිය එංජින් ලබා දී තිබෙන අතර දුම්රිය සේවකයන්ගේ කුසලතා සංවර්ධනය කිරීම සඳහා සහාය ලබා දී තිබෙනවා. උතුරේ කන්කසන්තුරේ වරාය වැඩිදියුණු කිරීම සඳහා අප ඇමරිකානු ඩොලර් මිලියන 45 ක් පමණ ලබා දෙනවා.

ඉන්දියානු සමාගම් විසින් පානීය ජලය බෙදා හැරීම සහ අපවිත්‍ර ජලය කළමනාකරණය කිරීම යන ව්‍යාපෘතීන් වලද නියැලී සිටිනවා. එක්සිම් බැංකුවේ මූල්‍ය සම්පාදනයන් යටතේ ආසන්න වශයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 600 ක වටිනාකමින් යුත් ව්‍යාපෘතීන් දැනට ක්‍රියාත්මක වෙමින් පවතිනවා.

අපට හැකි සෑම අයුරකින්ම ශ්‍රී ලංකාවට උපකාර කිරීමට අප සූදානම්. අපගේ සහයෝගය එක් අංශයකට හෝ ප්‍රදේශයකට සීමා වන්නේ නැහැ. ශ්‍රී ලංකාවට අපෙන් අවශ්‍ය වන්නේ කුමක්ද අප ඒ අනුව කටයුතු කරනවා.

**ප්‍රශ්නය – ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර පවතින නිදහස් වෙළඳ ගිවිසුම ශ්‍රී ලංකාවට වඩා ඉන්දියාවට වාසිදායක වී තිබේද?**

2000 වසරේදී ඉන්දියාව සහ ශ්‍රී ලංකාව නිදහස් වෙළඳ ගිවිසුමකට එළඹුණා. මෙය රටවල් දෙකම නිදහස් වෙළඳ ගිවිසුමකට එළඹි ප්‍රථම අවස්ථාවයි. එක් ආකාරයකින් අප දෙරටම ආර්ථික ඒකාබද්ධතාවයේ වැදගත්කම වටහාගත් පුරෝගාමී රාජ්‍යයන් දෙකක්. අප මෙම වෙළඳ ගිවිසුම අත්සන් කළ දින සිට ද්විපාර්ශවීය වෙළඳාම අට ගුණයකින් වර්ධනය වී තිබෙනවා. වෙළඳ ශේෂය ඉන්දියාවට වාසිදායක අයුරින් පවතින නිසා වෙළඳ ගිවිසුම ශ්‍රී ලංකාවට වඩා ඉන්දියාවට වාසිදායක වී ඇති බවට මතයක් තිබෙනවා. නමුත් මෙය සම්පූර්ණයෙන්ම කිසිදු පදනමකින් තොර මතයක්. වෙළඳ ශේෂය, වෙළඳ ගිවිසුමක් වාසිදායක වී ඇත්තේ කුමන පාර්ශවයටද යන්න ප්‍රකාශ කරන නිර්ණායකයක් නොවන බව ඕනෑම ආර්ථික විද්‍යාඥයෙක් ඔබට පවසාවි.

මේ පිළිබඳව නිවැරදි අදහසක් ලබා ගැනීමට නම් සංඛ්‍යා දත්ත දෙස බැලිය යුතුයි. නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ඉන්දියාවට යවන ශ්‍රී ලංකා අපනයනයන්ගේ පංගුව 2000 වසරේදී 16% යි. මෙය මෑත වසර වලදී 65% කට වඩා ඉහළ ගොස් තිබෙනවා. මෙයින් අදහස් වන්නේ ශ්‍රී ලංකාව විසින් ඉන්දියාවට යවන අපනයනයන්ගෙන් බහුතරය නිදහස් වෙළඳ ගිවිසුම හරහා සිදු වන බවයි.

අනෙක් අතින් බලන විට නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ඉන්දියාව ශ්‍රී ලංකාවට යවන අපනයනයන්ගේ පංගුව 2000 වසරේදී 9%ක් වූ අතර මෙය මෑත වසර වලදී ඉහළ ගොස් ඇත්තේ 13% දක්වා පමණයි. මෙයින් පෙනී යන්නේ ඉන්දියාව විසින් ශ්‍රී ලංකාවට යවන අපනයනයන්ගෙන් බහුතරය නිදහස් වෙළඳ ගිවිසුමට අයත් නොවන බවයි.

සමස්තයක් වශයෙන් අපගේ අවධානය යොමු විය යුත්තේ අපගේ වෙළඳ සහ ආයෝජන ප්‍රවාහයන් තවත් ඉහළ නංවා ගැනීමටයි. මා ඉන්දියා – ශ්‍රී ලංකා සබඳතා වෙළඳ ගනුදෙනුවක දෘෂ්ටිකෝණයෙන් දකින්නේ නෑ.

**ප්‍රශ්නය - දෙරට අතර යෝජිත ආර්ථික සහ තාක්ෂණික සහයෝගිතා ගිවිසුම (එට්කා ගිවිසුම - ETCA) මෙම වසර අවසානය වන විට අත්සන් තැබෙනු ඇතැයි වාර්තා වෙනවා. එට්කා ගිවිසුම පිළිබඳ ශ්‍රී ලංකාවේ විශාල මතභේදාත්මක තත්වයක් පවතිනවා. මේ සම්බන්ධයෙන් ඔබගේ ප්‍රතිචාරය කෙබඳුද?**

මා මීට පෙරත් කිහිප වතාවක්ම ප්‍රකාශ කර තිබෙන පරිදි අප ඔබට පහසු වේගයකින් ඉදිරියට යාමට සූදානම්. මේ සම්බන්ධයෙන් තවදුරටත් පැහැදිලි කරනවා නම්, සමස්ත ලෝකයම ඉන්දියානු වෙළඳපොළ පිළිබඳව අවධානය යොමු කර තිබෙනවා.

ගෝලීය වශයෙන් රටවල් බදු සහන පදනම් කරගත් වෙළඳ කටයුතු වල සිට ආයෝජන හා බැඳුණු වෙළඳ ප්‍රවාහයන් වෙත යොමුවන බව අප දකිනවා. ද්විපාර්ශවීය සන්දර්භය තුළ මෙහි ප්‍රතිලාභ අප දැක තිබෙනවා. එම ප්‍රතිලාභ තවදුරටත් ඉහළ නංවා ගැනීමට අප එක්ව කටයුතු කළ යුතුයි. වෙළඳ ගිවිසුම් ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් අප අතීතයෙන් උගත යුතු පාඩම් තිබේ නම්, අප ඒවා පිළිබඳවද අවධානය යොමු කළ යුතුයි. අප ඒ පිළිබඳව කටයුතු කරන්නේ විවෘත මනසකින්. අපට අවශ්‍ය මෙම සමස්ත ක්‍රියාවලියම සුමට, කඩිනම් සහ පහසු කිරීමටයි.

ඉන්දියාවේ දළ ජාතික නිෂ්පාදනයෙන් 64%කට හා ශ්‍රී ලංකාවේ දළ ජාතික නිෂ්පාදනයෙන් 56%කට දායකත්වය ලබා දෙන සේවා අංශය දෙරටටම එක හා සමානව වැදගත්. බොහෝ විට සේවාවක් ලබා දීමේදී අපට ඒ පිළිබඳව දැනෙන්නේ නැහැ. උදාහරණයක් ලෙස, ඉන්දියාවට පැමිණෙන සහ ඉන්දියාවෙන් පිටත් වන ගුවන්ගමන් වලින් 80%කට පමණ දායකත්වය ලබා දෙන්නේ ඉන්දීය ගුවන් සේවා විසින් නොව ශ්‍රී ලංකන් ගුවන් සේවය විසින්. ශ්‍රී ලංකන් ගුවන් සේවය ඉන්දියාවේ විශාලතම විදේශ ගුවන් සේවා සම්පාදකයා බවට පත්ව ඇති අතර එය ඉන්දියාවේ නගර 14කට පමණ ගුවන් සේවා මෙහෙයවනවා.

එසේම කොළඹ වරායේ නැව්ගතකිරීම් වලින් 70%කට වැඩි ප්‍රමාණයක් ඉන්දියාව හා සම්බන්ධයි. මෙය පැහැදිලිවම ඉන්දීය අපනයන සහ ආනයනකරුවන්ට සේවයක්. ශ්‍රී ලංකාව සේවා අංශය තුළ ශක්තිමත්. අපගේ ආර්ථික ගනුදෙනු වර්ධනය වීමත් සමඟ අප සේවා අංශය තුළත් සහයෝගීතාවය ඉහළ නංවාගත හැකි අවස්ථාවන් සොයා ගත යුතුයි.

මේ පිළිබඳව සැකයක් තබා ගන්න එපා. අප ශ්‍රී ලංකාවේ දේපළ, සම්පත්, රැකියා සහ වෙළඳපොළ උදුරාගැනීමට උත්සහ කරන්නේ නැහැ. අනෙක් අතට, ගෝලීය වර්ධන කේන්ද්‍රයක් වන ඉන්දියාවට ආසන්නයේ පිහිටා තිබීමෙන් ශ්‍රී ලංකාවට බොහෝ වාසි ලබා ගත හැකියි.

**ප්‍රශ්නය - ඔබගේ බොහෝමයක් දේශනයන්හිදී ඉන්දියාවේ වර්ධනයෙන් සහ භූගෝලීය වශයෙන් ඉන්දියාව ආසන්නයේ පිහිටීමෙන් ශ්‍රී ලංකාවට ලබා ගත හැකි ප්‍රතිලාභ පිළිබඳව කතා කරනවා. මේ අනුව ඉන්දියාවේ දැවැන්ත වෙළඳපොළට ශ්‍රී ලංකාවට ප්‍රවේශ විය හැක්කේ කෙසේද?**

ඉන්දියාවේ ආර්ථික පරිවර්තනයේ ප්‍රමාණය සහ වේගය සැමටම අවස්ථාවන් උදා කරදී තිබෙනවා. ඉන්දියාව සමඟ පවතින ඓතිහාසික සම්බන්ධතා සහ සමීප භූගෝලීය පිහිටීම සැලකිල්ලට ගැනීමේදී ශ්‍රී ලංකාව සඳහා පවතින අවස්ථාවන් ඉතාම සුවිශේෂියි.

විශාල ඉන්දීය සමාගම්වල සැපයුම් සහ අගය දාමයන්ගේ කොටසක් වන ලෙස අප ශ්‍රී ලාංකේය සමාගම් දිරිමත් කරනවා. මෙය ඉන්දීය සමාගම්ද ශ්‍රී ලංකාව හා සම්බන්ධ වීමට ධෛර්යමත් කරනු ඇති.

විශේෂයෙන්ම යම් නිශ්චිත වෙළඳපොළකට අදාළ නිෂ්පාදන සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ආර්ථිකයට විශිෂ්ට ප්‍රබලතාවයන් පවතිනවා. ශ්‍රී ලාංකේය සමාගම් රැසක් මේ බව වටහා ගෙන තිබීම සතුටට කරුණක්. එසේම එම සමාගම් ඉන්දියාව වැනි විශාල සහ තරඟකාරී වෙළඳපොළක් තුළ ඉතා හොඳින් කටයුතු කරනවා. සමස්ත ඉන්දියාව පුරා එකවරම සිය ව්‍යාපාර කටයුතු සිදු කිරීමට ශ්‍රී ලාංකේය සමාගමකට අසීරු විය හැකියි. දැවැන්ත දේශීය වෙළඳපොළ පිළිබඳව අවධානයෙන් සිටින බොහෝ ඉන්දීය සමාගම් ශ්‍රී ලංකාවේ වෙළඳපොළේ පවතින අවස්ථාවන් පිළිබඳව නොදැන සිටීමට පුළුවන්.

ඉන්දීය ව්‍යාපාර ප්‍රජාව හා සම්බන්ධ වන ලෙස මා ඔබ සැමව ධෛර්යමත් කරනවා. ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ අප අපට හැකි සෑම අයුරකින්ම ශ්‍රී ලාංකේය සමාගම්වලට මේ සඳහා උපකාරී කිරීමට කැමතියි.

**ප්‍රශ්නය - නිපුණතා සංවර්ධනයේ අවශ්‍යතාවය සහ ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර තරුණ තරුණියන් හුවමාරු වැඩසටහන් පිළිබඳව ඔබ ඔබගේ දේශනවල දී පුළුල් ලෙස කතා කර තිබෙනවා. අප අපගේ හැකියාව පූර්ණ ලෙස භාවිතයට ගෙන තිබෙනවාද?**

අපගේ හෙට දින වර්තමාන පන්ති කාමර තුල රැඳී පවතින බව මා දැඩිව විශ්වාස කරනවා. අපගේ ද්විපාර්ශ්වික සම්බන්ධතාවයේ ප්‍රධාන කුළුණක් වන්නේ අධ්‍යාපනය හා කුසලතා සංවර්ධනයි.

ඉන්දීය රජය විසින් වාර්ෂිකව ශ්‍රී ලාංකේය ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට පූර්ව විශ්ව විද්‍යාල, උපාධි, පශ්චාත් උපාධි සහ ආචාර්ය උපාධි සඳහා ශිෂ්‍යත්ව 750 ක් පිරිනමනවා.

පසුගිය වසරේ සිට අපගේ ප්‍රමුඛ පෙළේ තාක්ෂණික ආයතන ශ්‍රී ලාංකේය සිසුන්ට විවෘත කර තිබෙනවා. IIT ඒකාබද්ධ ප්‍රවේශ විභාගය පසුගිය වසරේ මැයි මාසයේදී පළමු වරට කොළඹදී පවත්වනු ලැබුවා. ශ්‍රී ලාංකේය සිසුන්ට ඉන්දියානු වෛද්‍ය විද්‍යාලවල වෛද්‍ය සහ දන්ත වෛද්‍ය උපාධි හැදෑරීම සඳහා ජාතික සුදුසුකම් ලැබීමේ සහ ඇතුළත්වීමේ පරීක්ෂණයට (NEET) පෙනීසිටීම සඳහාද අවස්ථාව ලබා දී තිබෙනවා. ශ්‍රී ලාංකේය තරුණ තරුණියන් මෙම අවස්ථා තුළින් උපරිම ප්‍රයෝජන ලබා ගනු ඇතැයි ඇතැයි අප බලාපොරොත්තු වෙනවා

මීට අමතරව, 1964 වසරේ සිට ඉන්දියාව විසින් ඉන්දියානු තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතා වැඩසටහන (ITEC) යටතේ කෙටි කාලීන පුහුණු වැඩසටහන් සඳහා පූර්ණ ශිෂ්‍යත්ව ලබා දෙනවා. මේ වසරේ ඉන්දියානු තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතා වැඩසටහන (ITEC) යටතේ ශ්‍රී ලංකාව වෙනුවෙන් අවස්ථා 400 ක් අප වෙන් කර තිබෙනවා. ශ්‍රී ලංකා රජයේ නිලධාරීන්ට සහ කර්මාන්ත සාමාජිකයන්ට මෙම වැඩසටහන් වලින් ප්‍රයෝජන ලබා ගත හැකියි.

මෙයට අමතරව, ශ්‍රී ලංකාවේ ඉල්ලීම් මත අප විශේෂ පුහුණු වැඩසටහන්ද පවත්වනවා.

අප දෙරටේ පාසැල් සහ විශ්ව විද්‍යාල අතර ශිෂ්‍ය හුවමාරු වැඩසටහන්ද ආරම්භ කර තිබෙනවා. උදාහරණයක් ලෙස, 1847 දී ආරම්භ කරන ලද සනාවර්හි ලෝරන්ස් පාසලේ සිසුන් මීට මාස කිහිපයකට පෙර 1835 වසරේදී පිහිටුවන ලද කොළඹ රාජකීය විද්‍යාලයේ සංචාරයක නිරත වුණා. එසේම රාජකීය විද්‍යාලයේ සිසුන් පිරිසක්, සනාවර්හි ලෝරන්ස් පාසලේ සංචාරය කිරීමට නියමිතයි. දිල්ලියේ ශ්‍රී රාම් වාණිජ විද්‍යාලය සහ කැළණිය විශ්ව විද්‍යාලය අතරද ගිවිසුමක් ඇති කරගෙන තිබෙනවා. තව තවත් එවැනි වැඩසටහන් කිරීමට අප කැමතියි.

**ප්‍රශ්නය - ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර සමීප සම්බන්ධතාවයක් පැවතියත් දෙරට අතර තිබෙන ධීවර ගැටළුව තවමත් සතුටුදායි අයුරින් විසඳී නැහැ. මෙම ගැටළුව විසඳීම සඳහා ඉන්දීය රජය පියවර ගෙන තිබෙනවාද?**

කිසිදු අභියෝගයක් ජයගත නොහැකි තරම් විශාල නොවන බව මා දැඩිව විශ්වාස කරනවා. ධීවර ගැටළුව අන්‍යෝන්‍ය වශයෙන් සතුටුදායි අයුරින් විසඳාගැනීම සඳහා ඉන්දීය රජය සහ තමිල්නාඩු ප්‍රාන්ත රජය විවිධ පියවර රැසක් ගෙන තිබෙනවා.

පොක් සමුද්‍රසන්ධියේ සිදුකරන ට්‍රෝලින් ධීවර ක්‍රමය වෙනුවට ගැඹුරු මුහුදේ ධීවර කටයුතු දිරිමත් කිරීම සඳහා විවිධ පියවර ගෙන තිබෙනවා. මුළු පෝක් සමුද්‍ර සන්ධියේම බොටම් ට්‍රෝලින් යාත්‍රා ලියාපදිංචිය 2017 මාර්තු මාසයේ සිට තහනම් කොට තිබෙනවා.

මන්නාරම් බොක්කෙහි පිහිටි මූකායියූර් සහ බෙංගාල බොක්ක වෙරළෙහි පිහිටි පූම්පුහාර් යන ප්‍රදේශයන්හි ඇමරිකානු ඩොලර් මිලියන 40ක වියදමෙන් නව ධීවර වරායන් ඉදිකෙරෙමින් පවතින අතර එය ඉන්දියානු ධීවරයන් පෝක් සමුද්‍රසන්ධියේ සිට අරාබි මුහුද හෝ බෙංගාල බොක්ක දෙසට යොමු කරනු ඇති. පූම්පුහාර් ධීවර වරායේ ඉදිකිරීම් කටයුතු බොහෝ දුරට අවසන් අතර මූකායියූර් ධීවර වරායේ ඉදිකිරීම් ලබන වසරේදී නිම කිරීමට අපේක්ෂිතයි. මන්නාරම් බොක්කෙහි පිහිටි කුන්තුකාල්හි නව මත්ස්‍ය ගොඩබෑමේ මධ්‍යස්ථානයක්ද ඉදිකෙරමින් පවතිනවා.

බොටම් ට්‍රෝලින් යාත්‍රා කොටස්වලට ගැලවීමට සහ ඒවා වෙනුවට ගැඹුරු මුහුදේ ධීවර කටයුතු සිදුකරන යාත්‍රා යොදගැනීම සඳහා ඉන්දියානු රජය සහ තමිල්නාඩු ප්‍රාන්ත රජය ඇමරිකානු ඩොලර් මිලියන 56කට වැඩි මුදලක් වෙන්කර තිබෙනවා. මෙම යෝජනාක්‍රමය යටතේ බොටම් ට්‍රෝලින් යාත්‍රා වෙනුවට ගැඹුරු මුහුදේ ධීවර කටයුතු සිදුකරන නව යාත්‍රා මිලදී ගැනීම සඳහා ධීවරයන්ට සහනාධාරයක් ලබා දෙනු ඇති. එසේම මේ යටතේ ගැඹුරු මුහුදේ ධීවර කටයුතු සම්බන්ධයෙන් ධීවරයන්ට විවිධ ආයතනයන්හිදී පුහුණුවද ලබා දෙනු ඇති.

මහ මුහුදේදී ධීවරයන්ගේ සුරක්ෂිතතාවය තහවුරු කිරීම සඳහා නවීන සන්නිවේදන උපකරණ ලබාදීමේ විශේෂ යෝජනා ක්‍රමයක් ද ක්‍රියාත්මක කර තිබෙනවා. හෑන්ඩ් සෙට් (hand sets) 17,000 කට අධික ප්‍රමාණයක් ධීවරයන් අතර බෙදා දී තිබෙනවා.

මේ අතර ධීවරයන් ජාත්‍යන්තර මුහුදු සීමාව නොදැනුවත්ව උල්ලංඝනය කිරීම වැළැක්වීම සඳහා ධීවර යාත්‍රා නිරීක්ෂණ පද්ධතිය (Vessel Monitoring System - VMS) නමින් චන්ද්‍රිකා තාක්ෂණය පදනම් කරගත් විශේෂ හඳුනාගැනීමේ පද්ධතියක්ද ISRO හි GSAT-6 චන්ද්‍රිකාව භාවිතා කරමින් නිර්මාණය කර තිබෙනවා. මේ වන විට එය සවිකිරීම සඳහා පරීක්ෂණ කටයුතු සිදු කෙරෙමින් පවතිනවා.

එසේම ඉන්දියානු රජය ධීවර කටයුතු වෙනුවට ජලජ පැළෑටි වගා කිරීම ආදි විකල්ප ජීවනෝපාය මාර්ග ප්‍රවර්ධනය කිරීමද සිදු කරනවා.

බුදුරාජාණන් වහන්සේ දේශනා කළ පරිදි, ''ප්‍රශ්නයක් මඟ හැරීමට ඇති පහසුම ක්‍රමය එය විසඳීම'' යි.

**ප්‍රශ්නය - බුදුන් වහන්සේ ගැන කතා කිරීමේදී, ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර බෞද්ධ සබඳතා වැඩිදියුණු කිරීමට ඔබ ගන්නා ලද උත්සාහයන් පිළිබඳ විස්තර කිහිපයක් බෙදා ගත හැකිද?**

බුදුදහම අපව එක්සත් කරන බලයක්. බුදුදහමට සමස්ත ලෝකයම එක්සත් කිරීම සඳහා බලය ඇති බව මා දැඩිව විශ්වාස කරනවා.

බුදුරජාණන් වහන්සේ ඉන්දියාවේ අග්‍රගණ්‍ය මාණික්‍යය වන බව අග්‍රාමාත්‍ය මෝදි මැතිතුමා කියා තිබෙනවා. 2017 මැයි මාසයේදී ශ්‍රී ලංකාවේ පවත්වන ලද එක්සත් ජාතීන්ගේ අන්තර්ජාතික වෙසක් දින සැමරුම් සඳහා එතුමා ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වීම බුදුරජාණන් වහන්සේට සහ උන්වහන්සේගේ ඉගැන්වීම් වලට එතුමාගේ ඇති දැඩි ගෞරවය සහ ලැදියාව පෙන්වනවා. එම සංචාරයේදී එතුමා දළදා මාළිගාව වැඳ පුදා ගත් අතර මහා නායක හිමිවරුන්ගේ ආශිර්වාදයද ලබා ගත්තා. එතුමා 2015 වසරේදී සිදු කරන ලද සංචාරයේදී අනුරාධපුරයේ ජය ශ්‍රී මහා බෝධිය වැඳ පුදා ගත් අතර කොළඹ පිහිටි මහා බෝධි සමාජයටද ගියා.

ඔබලාට මතක නම්, පසුගිය වසරේදී ජාත්‍යන්තර මට්ටමේ වැලි නිර්මාණ ශිල්පයෙකු වන සුදර්ශන් පට්නායක් මහතා ලෝකයේ විශාලතම වැලි බුදු පිළිමය ශ්‍රී ලංකාවේ නිර්මාණය කෙරුවා. එසේම, ඉන්දියාව දිග්බොයි හි (අසෑම්) පිහිටි දැනට ක්‍රියාත්මක ලොව පැරණිතම පිරිපහදුවේදී අතින් සාදන ලද ඉටිපන්දම් දහස් ගණනක් ද වෙසක් පොහොය නිමිත්තෙන් පරිත්‍යාග කළා.

මෙම වසරේ වෙසක් පොහොය වෙනුවෙන් අපි සාරානාත් සර්වඥ ධාතු ප්‍රදර්ශනයක් කොළඹ දී සංවිධානය කළා. මෑතකදී අප ශ්‍රී ලංකා සන්නද්ධ හමුදාවල සාමාජිකයින් 160 දෙනෙක් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් සඳහා විශේෂ ඉන්දීය ගුවන් හමුදා යානයකින් බුද්ධ ගයාව වෙත විශේෂ සංචාරයක් සංවිධානය කළා. එම සංචාරයෙන් පසු ඔවුන්ව හමුවූ අවස්ථාවේදී මා ඔවුන්ගේ ඇස්වල තිබෙන සතුට දැක්කා.

ශ්‍රී ලංකාවේ පිහිටි රාමායනය හා සම්බන්ධ ස්ථාන ඉන්දියානු ජනතාව අතර ජනප්‍රිය සේම ඉන්දියාවේ ප්‍රධාන බෞද්ධ සිද්ධස්ථාන ශ්‍රී ලාංකිකයන් අතර ජනප්‍රියයි. අග්‍රාමාත්‍ය මෝදි විසින් පොරොන්දු වූ පරිදි එයා ඉන්ඩියා සමාගම කොළඹ සහ වරණාසි අතර සෘජු ගුවන් ගමන් ආරම්භ කර තිබෙනවා. පසුගිය වසරේදී ඉන්දීය සංචාරකයන් ලක්ෂ 4කට ආසන්න පිරිසක් ශ්‍රී ලංකාවට පැමිණ ඇති අතර ශ්‍රී ලාංකිකයන් ලක්ෂ 3ක් පමණ ඉන්දියාවේ සංචාරය කර තිබෙනවා. ඇත්ත වශයෙන්ම අපි ඉන්දියාවට පැමිණෙන ශ්‍රී ලාංකික වන්දනාකරුවන්ට වීසා 50,000 ක් පමණ නොමිලේ නිකුත් කර තිබෙනවා. දෙරටෙහි ජනතාව අතර ඇති සම්බන්ධතාවය ශ්‍රී ලංකාව සමඟ අපගේ සබඳතාවයේ ශක්තිමත්ම අංගයක්.

විශේෂයෙන්ම අපට ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ තරුණ පරපුර අතර සම්බන්ධතා ඉහළ නංවාගන්න පුළුවන්. පසුගිය වසරේදී මහනුවර ශ්‍රී ලංකා ජාත්‍යන්තර බෞද්ධ ඇකඩමියේ උපාධි ප්‍රධානෝත්සවයට මා සහභාගී වුණා. එහිදී සිසුන් හමුවූ අවස්ථාවේදී ඔවුන්ට වඩා හොඳ සහ දීප්තිමත් අනාගතයක් සඳහා තිබෙන බලවත් උනන්දුව මා දුටුවා. බුදුරජාණන් වහන්සේ විසින් පෙන්වා දුන් මාර්ගය එම දීප්තිමත් අනාගතය කරා පියනැගීමට අපට නිසැකවම උපකාරී කරනු ඇති.

උසස් අවබෝධය තුළ විද්‍යාව සහ ආධ්‍යාත්මය එකිනෙකින් වෙන්වනවාට වඩා එකට එක්වන බව මාගේ විශ්වාසයයි.

**ප්‍රශ්නය - ඉන්දියාව ශ්‍රී ලංකාව තුළ චීනයේ බලපෑම තුලනය කිරීමට උත්සහ ගන්නා බවට මාධ්‍ය තුළ විශාල වශයෙන් වාර්තා වෙනවා. අවසාන වශයෙන් ඒ පිළිබඳ ඔබේ අදහස කුමක්ද?**

ශ්‍රී ලංකාව සමඟ අපගේ සබඳතා ගොඩනැගී ඇත්තේ අපටම අවේණික ආකාරයකින් ස්වාධීනවයි. අප දෙරට අතර සම්බන්ධතා වෙනත් තෙවන පාර්ශවීය රටක් මත රඳා පවතින්නේ නැහැ.

******